1st Place Winner
National Productivity
Award 2020

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
## பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
## CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| මගේ අංකය / எமது இல. / My Ref. | CSS/03/06/ANN/TR/2026 | ඔබේ අංකය / உமது இல. / Your Ref. | | දිනය / திகதி / Date | 2026.09. 25 |
|---|---|---|---|---|---|

ආණ්ඩුකාර ලේකම්, සභා ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරු / සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් / ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,
දකුණු පළාත.

**වාර්ෂික ස්ථාන මාරු - 2026**

**දකුණු පළාත් ප්‍රධාන ලේකම් ස්ථාන මාරු සමාලෝචන (අභියාචනා) මණ්ඩල තීරණ දැනුම් දීම.**

2026 වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් මා විසින් නිකුත් කරන ලද 2026.03.16 දිනැති ප්‍රධාන ලේකම් පරිපාලන චක්‍රලේඛ අංක 01/2026 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. ඒ අනුව, දකුණු පළාත් සභාවේ සංවර්ධන නිලධාරී / කළමනාකරණ සේවා නිලධාරී / රියදුරු / කාර්යාල සේවක සේවය යන සේවාවන්හි නිලධාරීන් සම්බන්ධයෙන් 2026 වාර්ෂික ස්ථාන මාරුවීම් යටතේ ප්‍රධාන ලේකම් අභියාචනා මණ්ඩලයේ නිර්දේශ මත සකසන ලද සමාලෝචන (අභියාචනා) මණ්ඩල තීරණ මේ සමඟ අමුණා ඇති අතර, එම තීරණ ප්‍රධාන ලේකම් නිල වෙබ් අඩවියට (www.cs.sp.gov.lk) මුදා හැර ඇති බව කාරුණිකව දන්වමි.

- ඇමුණුම 01 - සංවර්ධන නිලධාරී සේවයේ ප්‍රධාන ලේකම් අභියාචනා මණ්ඩල තීරණ
- ඇමුණුම 02 - කළමනාකරණ සේවා නිලධාරී සේවයේ ප්‍රධාන ලේකම් අභියාචනා මණ්ඩල තීරණ
- ඇමුණුම 03 - රියදුරු සේවයේ ප්‍රධාන ලේකම් අභියාචනා මණ්ඩල තීරණ
- ඇමුණුම 04 - කාර්යාල සේවක සේවයේ ප්‍රධාන ලේකම් අභියාචනා මණ්ඩල තීරණ

03. 2026 වාර්ෂික ස්ථාන මාරුවීම් යටතේ මගේ සමාංක හා 2026.08.19 දිනැති ලිපිය මඟින් දැනුම් දී ඇති පරිදි, ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක වන දිනය 2026.10.07 දින ලෙස සටහන් වුවත්, එදිනට වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක නොවන අතර, දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් වන අභියාචනා සලකා බැලීමෙන් අනතුරුව, තවදුරටත් අභියාචනා නොකරන ලද නිලධාරීන් හට වාර්ෂික ස්ථාන මාරුවීම්, ක්‍රියාත්මක වන දිනය ඉදිරියේදී දැනුම් දීමට කටයුතු කරන බව දන්වමි.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary } 091 2222603
කාර්යාලය / அலுவலகம் / Office } 091 4119011, 091 2234052
091 2246299
chiefsec1@sltnet.lk
www.cs.sp.gov.lk
එස්.එච්. දහනායක මාවත, ගාල්ල. S.H. Dahanayaka Mawatha, Galle. எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.

"ඩිජිටල් නවෝත්පාදනයෙන් ගුණාත්මක රාජ්‍ය සේවයක්"

04. නියමිත කාල සීමාව තුළදී දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා කිරීමට හැකි වන පරිදි, ඔබ යටතේ පවතින දිස්ත්‍රික්, කලාප හා ප්‍රාදේශීය ආයතන ප්‍රධානීන්ටද, අදාළ වන පරිදි ප්‍රාදේශීය ලේකම්වරුන් වෙතද, අභියාචනා තීරණ දැනුම් දීමට අභ්‍යන්තර වැඩපිළිවෙළක් සකස් කළ යුතු බව දන්වමි.

05. 2026 වාර්ෂික ස්ථාන මාරු මණ්ඩල තීරණ හෝ සමාලෝචන (අභියාචනා) මණ්ඩල තීරණ සම්බන්ධයෙන් තවදුරටත් අතෘප්තියට පත් නිලධාරීන්ට 2026.03.16 දිනැති ප්‍රධාන ලේකම් පරිපාලන චක්‍රලේඛ අංක 01/2026 හි අංක 09 ප්‍රකාරව දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කළ හැක. නියමිත ආකෘතියට පටහැනි හෝ නියමිත දිනට පසුව ලැබෙන අභියාචනා අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06. ඒ අනුව, 01/2026 දරණ ප්‍රධාන ලේකම් පරිපාලන චක්‍රලේඛයේ ආකෘති අංක **05** ප්‍රකාරව සකස් කරන ලද අභියාචනා අයදුම්පත්‍රය ආසන්නතම මාණ්ඩලික නිලධාරියා මඟින් සෘජුවම **2026.10.07** දිනට පෙර හෝ ඊට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් පමණක් (ලියුම්කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"2026** වාර්ෂික ස්ථාන මාරු රා.සේ.කො. අභියාචනා" ලෙස සටහන් කරන්න.) මා වෙත ලැබීමට සැලැස්විය යුතු අතර **කිසිදු නිලධාරියෙකුට සෘජුවම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත සිය අභියාචනා අයදුම්පත්‍රය ඉදිරිපත් කල නොහැකි බව අවධාරණය කරමි.**

07. නිසි නිල මඟින් අභියාචනා ඉදිරිපත් කිරීමේදි ඇති වන ප්‍රමාදය වලක්වා ගැනීම සඳහා සෘජුවම ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත සිය අභියාචනා අයදුම්පත්‍රය යොමු කිරිමට ආයතන ප්‍රධානින් විසින් අදාළ නිලධාරින් හට අවස්ථාව සලසා දිය යුතු ය.

08. ඒ අනුව, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතට අභියාචනා අයදුම්පත් යොමු කරන නිලධාරීන්ගේ ස්ථාන මාරු එම කොමිෂන් සභාවේ තීරණ දැනුම් දෙන තුරු තාවකාලිකව අත්හිටුවනු ලබන අතර, ඒ බැව් එකී ස්ථාන මාරු ගැලපුමට අදාළ අනෙකුත් සියලු නිලධාරීන්ගේ ආයතන ප්‍රධානීන් හට දැනුම් දීමට මා විසින් කටයුතු කරනු ලැබේ.

09. එසේම, මා විසින් නිකුත් කරන ලද අංක 01/2026 හා 2026.03.16 දිනැති ප්‍රධාන ලේකම් පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව, මෙම 2026 වාර්ෂික ස්ථාන මාරු අභියාචනා මණ්ඩල තීරණවල මුද්‍රිත පිටපත් දකුණු පළාත් සභාවේ සියලු ආයතන වෙත යොමු නොකරන බව කාරුණිකව දන්වා සිටිමි.

**චන්දිම සී. මුහන්දිරම්ගේ**
**ප්‍රධාන ලේකම්**
**දකුණු පළාත**

චන්දිම සී. මුහන්දිරම්ගේ
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

පිටපත් :
01. ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය, දකුණු පළාත. - දැ.ගැ.ස / අ.ක.ස.
02. ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, දකුණු පළාත. - දැ.ගැ.ස / අ.ක.ස.

ආකෘති අංක 05

# 2026 වාර්ෂික ස්ථාන මාරු තීරණ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කිරීම

## අභියාචක නිලධරයා පිළිබඳ තොරතුරු

**අ. පෞද්ගලික තොරතුරු**

| | | | |
|---|---|---|---|
| 01. මුලකුරු සමග නම :- | | | |
| 02. තනතුර හා පන්තිය :- (ශ්‍රේණිය) | | | |
| 03. උපන් දිනය :- අවුරුදු/ මාස/ දින | | 04. වයස :- අවු ....... මාස ...... දින ........ (2026.06.30 දිනට) | |
| 05. ජාතික හැඳුනුම්පත් අංකය :- | | 06. ස්ත්‍රී පුරුෂ භාවය | |
| 07. ස්ථිර ලිපිනය :- | 08. තාවකාලික ලිපිනය :- | 09. දුරකථන අංකය කාර්යාලය: පෞද්ගලික: | |
| 10. විවාහක අවිවාහක බව :- | 11. කලත්‍රයාගේ නම :- | 12. කලත්‍රයාගේ රැකියාව හා සේවා ස්ථානය :- | |
| 13. දරුවන් ගණන :- | 14. 2026.06.30 දිනට ඔවුන්ගේ වයස :- | 15. ඉගෙනුම ලබන පාසල් :- | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

**ආ.) සේවා තොරතුරු**

| | | | |
|---|---|---|---|
| 16. මුල් පත්වීම් දිනය :- | | 17. වර්තමාන තනතුරට පත් වූ / අන්තර්ග්‍රහණය වූ දිනය :- | |
| 18. වර්තමාන ශ්‍රේණියට උසස්වීම් ලැබූ දිනය :- | | | |
| 19. වර්තමාන නිත්‍ය සේවා ස්ථානය :- | | 20. නිත්‍ය සේවා ස්ථානයේ ලිපිනය :- | |
| 21. පිහිටි නගරය / උප නගරය :- | | 22. අනුයුක්ත කර ඇත්නම් එම සේවා ස්ථානය :- | |

| | | | |
|---|---|---|---|
| 23. වර්තමාන නිත්‍ය සේවා ස්ථානය අයත් අමාත්‍යාංශය :- | | 24. දෙපාර්තමේන්තුව :- | |
| 25. ඉතා ප්‍රියමනාප සේවා ස්ථානයක සේවය කර තිබේද යන්න හා සේවය කර ඇත්නම් එම සේවා ස්ථානය :- | | | |

| 26. රජයේ සේවයේ පූර්ව සේවා ස්ථාන (වර්තමාන සේවා ස්ථානයේ සිට අතීතයට අනුපිළිවෙලින් සඳහන් කරන්න.) | | | |
|---|---|---|---|
| සේවා ස්ථානය | ප්‍රියමනාප සේවා ස්ථානයකි/ ප්‍රියමනාප නොවන සේවා ස්ථානයකි | සේවා කාලය | |
| | | සිට | දක්වා |
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |
| 5. | | | |

## ඈ.) වාර්ෂික ස්ථාන මාරු ඉල්ලීම පිළිබඳ තොරතුරු

| | | |
|---|---|---|
| 27. වාර්ෂික ස්ථාන මාරු අයදුම් කිරීමේදී ස්ථාන මාරු අපේක්ෂා කර ඇත්ද නැත්ද යන්න :- (✓ ලකුණ යොදන්න) | ඇත | |
| | නැත | |
| 28. ස්ථාන මාරු අපේක්ෂා කර ඇත්නම්, අයදුම් කර ඇති සේවා ස්ථාන :-<br>1.<br>2.<br>3.<br>4.<br>5. | | |
| 29. වාර්ෂික ස්ථාන මාරු ලැබී තිබේ නම් එම සේවා ස්ථානය :- | | |
| 30. ස්ථාන මාරු චක්‍රය සමන්විත වන නිලධාරීන් සංඛ්‍යාව :- | | |
| 31. ප්‍රධාන ලේකම් වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන (අභියාචනා) කමිටුවට අයදුම් කර ඇත්ද නැත්ද යන්න :- (✓ ලකුණ යොදන්න) | ඇත | |
| | නැත | |
| 32. එම සමාලෝචන (අභියාචනා) කමිටුව වෙත කරන ලද ඉල්ලීම පිළිබඳ තොරතුරු :- | | |
| ස්ථාන මාරුව අවලංගු කිරීම | | |
| සංශෝධනය කිරීම | | |
| නව ස්ථාන මාරුවක් ලබා ගැනීම | | |
| 33. ස්ථාන මාරුව සංශෝධනය කිරීමට ඉල්ලුම් කළේ නම් එසේ ඉල්ලුම් කළ සේවා ස්ථාන :-<br>1.<br>2.<br>3. | | |
| 34. ප්‍රධාන ලේකම් ස්ථාන මාරු සමාලෝචන (අභියචනා) කමිටු තීරණය :- | | |

| |
|---|
| 35. ප්‍රධාන ලේකම් ස්ථාන මාරු සමාලෝචන / (අභියාචනා) කමිටු තීරණයට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හේතු :-<br>1.<br>2.<br>3. |
| 36. ඉහත හේතු සනාථ කිරීමට අදාළ ලිඛිත සාධකවල සහතික කළ පිටපත් පහත දැක්වෙන ඇමුණුම් වශයෙන් යා කර ඇත.<br>ඇමුණුම 01 ...............................................<br>ඇමුණුම 02 ...............................................<br>ඇමුණුම 03 ............................................... |
| 37. ඉල්ලා සිටිනු ලබන සහන :-<br>1.<br>2.<br>3. |

ඉහත දක්වා ඇති තොරතුරු සියල්ල හොඳින් කියවා බලා තේරුම් ගෙන සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි.

(අදාළ නිලධාරියාගේ මුලකුරු සහිත නම)

.................................................. .................................................

දිනය අත්සන

**ඈ.) ආයතන ප්‍රධානියාගේ / දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය**

| |
|---|
| 38. ප්‍රධාන ලේකම්, දකුණු පළාත.<br><br>i. …………………………………….. විසින් අනු අංක 01 සිට 26 දක්වා සම්පූර්ණ කර ඇති<br>(අදාළ නිලධාරියාගේ මුලකුරු සහිත නම)<br>තොරතුරු ඔහුගේ/ඇයගේ පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදි බවට සහතික කරමි.<br><br>ii. …………………………………….. ගේ ස්ථාන මාරු ඉල්ලීම අනුප්‍රාප්තිකයෙකු (සහිතව/<br>(අදාළ නිලධාරියාගේ මුලකුරු සහිත නම)<br>රහිතව/පසුව ලබා ගැනීමේ පදනම මත) නිර්දේශ කරමි / නිර්දේශ නොකරමි.<br><br>............................... .............................................<br>දිනය ආයතන ප්‍රධානියාගේ<br>අත්සන හා නිල මුද්‍රාව |
| 39. රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්, දකුණු පළාත.<br><br>i. ස්ථාන මාරු චක්‍රය සම්බන්ධ වන නිලධාරීන් ගණන :-<br><br>ii. අභියාචනය පිළිබඳ නිර්දේශය :-.<br><br>............................... ...............................................<br>දිනය දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ<br>අත්සන හා නිල මුද්‍රාව |